පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

ප්‍රධාන කරුණු ඇතුළත් ලේඛනය

ලීසිං සහ ණය

**1. මූල්‍ය කල්බදු**

| | |
|---|---|
| **නිෂ්පාදන යේ (මූල්‍ය කල්බදු පහසුකමේ ) විස්තරය සහ අරමුණ** | පාරිභෝගික භවතුන්ට ප්‍රමුඛත්වය දීම සඳහා වන අපගේ කැපවීම මූර්තිමත් කරමින්, වෘත්තිකයන්, ව්‍යාපාරිකයින් සහ ව්‍යාපාර ආයතන සඳහා මැනවින් සකස් කරන ලද ලීසිං (කල්බදු) විසඳුම් මාලාවක් අප විසින් ඉදිරිපත් කරනු ලැබේ.<br><br>පීපල්ස් ලීසිං සමාගම වෙතින් ලීසිං පහසුකමක් අපේක්ෂා කරන පාරිභෝගික භවතුන් සඳහා අපගේ ලීසිං පහසුකම් මඟින් විවිධ විශේෂාංග ගණනාවක් ලබා දෙයි. සමාගම විසින් මෝටර් රථ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා ලීසිං පහසුකම් සපයනු ලැබේ.<br><br>සමාගම විසින් උපරිම වශයෙන් වසර පහක කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාත ලීසිං පහසුකම් සහ වසර හතක කාලයක් දක්වා විචල්‍ය පොලී අනුපාත ලීසිං පහසුකම් සපයනු ලැබේ. කෙසේ වෙතත්, විචල්‍ය පොලී අනුපාත ලීසිං පහසුකම් තෝරාගත් වත්කම් කාණ්ඩ සඳහා පමණක් ලබාගත හැකිවන අතර, වෙළඳපල තත්ත්වයන් අනුව කළමනාකරණයේ අභිමතය පරිදි ලීසිං පහසුකම් පිරිනමනු ලැබේ.<br><br>පාරිභෝගික භවතුන්ට මෝටර් රථ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ මිලදී ගැනීමට හෝ තම වාණිජ හෝ පෞද්ගලික අවශ්‍යතා සඳහා මුදල් සපයා ගැනීමට ලීසිං පහසුකම් ලබාගත හැකිය. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | පීපල්ස් ලීසිං සමාගම වෙතින් ලීසිං පහසුකමක් ලබාගැනීමෙන් පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ භුක්ති විඳිය හැකිය. එනම්:<br><br>i. ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත පහසුකම් (කළමනාකාරීත්වයේ අභිමතය පරිදි විචල්‍ය පොලී අනුපාත පහසුකම් පිරිනමනු ලැබේ.)<br>ii. පාරිභෝගිකයාගේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි කස් කරන ලද නම්‍යශීලී කල්බදු වාරික.<br>iii. වසර 7ක් දක්වා කල්බදු කාලසීමාවන් (ස්ථාවර පොලී අනුපාත පහසුකම් සඳහා උපරිම වසර 5ක් සහිතව)<br>iv. නිශ්චිත කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාතයක් සහිතව ද, ඉන්පසු ඉතිරි කාලය සඳහා විචල්‍ය පොලී අනුපාතයක් සහිතව ද, මූල්‍යකරණ පහසුකම් ලබාගැනීමේ හැකියාව (විචල්‍ය පොලී අනුපාත කළමනාකාරීත්වයේ අභිමතයට යටත් වේ.)<br>v. හිඟ මුල් මුදල අර්ධ වශයෙන් අඩුකරගැනීම සඳහා මූල් මුදලට ගෙවීම් කිරීමේ හැකියාව (විචල්‍ය පොලී අනුපාත පහසුකම් සඳහා පමණක් ලබා ගත හැකිය.)<br>vi. ආපසු ගෙවීමේ කාලය තුළ දී, අදාළ වත්කම වෙනුවට ඉහළ වෙළඳ පොල වටිනාකමක් ඇති ඊට සමාන වත්කම් වර්ගයක් ලබාදීමේ හැකියාව. |
| **ඉලක්කගත වෙළඳ පොල** | මෙම ලීසිං පහසුකම සතුටුදායක ආපසු ගෙවීමේ හැකියාවක් සහිත පුද්ගලයින් සහ ව්‍යාපාරික ව්‍යවසායන් යන දෙඅංශයම ඉලක්ක කරනු ලැබේ. |

| | |
|---|---|
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. අවම පහසුකම් කාලය වසරකි.<br>ii. උපරිම පහසුකම් කාලය වසර හතකි.<br>iii. පහසුකම සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ලබා දීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි සිදුවේ.<br>iv. බදු දී ඇති වත්කම, ලීසි පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවීමකින් තොරව වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br>iv. ලීසිං පහසුකම සඳහා අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමක් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>පහත විස්තර ලබා දීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br><u>තනි පුද්ගලයන් **සඳහා**</u><br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදු ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරි සහතිකය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. වාහන විස්තර (සැපයුම්කරුගේ විස්තර/වාහනයේ විස්තර)<br><br><u>**ආයතනික පාරිභෝගික භවතුන් සඳහා**</u><br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය/**41**වන ආකෘතිය හෝ 1 වන ආකෘති පත්‍රය**)**<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (13 වන ආකෘතිය**)**<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (මූල්‍ය ප්‍රකාශ/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි ලේඛන)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v**.** වාහන විස්තර (සැපයුම්කරුගේ විස්තර/වාහන විස්තර) |
| **නීතිමය විධිවිධාන** | 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත |
| **පොලී අනුපාත** | පොලී අනුපාත පාරිභෝගිකයාගේ ණය අවදානම මත පදනම් වන අතර, 12% සිට 40% දක්වා පරාසයක පවතී. කෙසේ වෙතත්, ත්‍රිරෝද රථ සම්බන්ධයෙන් වන කල්බදු පහසුකම් සඳහා පොලී අනුපාතය උපරිම වශයෙන් 55% දක්වා ඉහළ යා හැකිය. |

**ගාස්තු සහ අයකිරීම්**

මූල්‍ය කල්බදු පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.

**i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව**

| පහසුකමේ වටිනාකම (රුපි. මිලියන) | සැකසුම් ගාස්තුව (රුපි.) | පරීක්ෂණ ගාස්තුව (රුපි.) | |
|---|---|---|---|
| | | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සුරැකුම සහිතව පහසුකම් | වෙනත් සුරැකුම |
| මිලියන 1 ක් දක්වා | 7,500 | 5,000 | 10,000 |
| 1.00 – 1.99 | 10,000 | | 12,500 |
| 2.00 – 2.99 | 12,500 | | 15,000 |
| 3.00 – 4.99 | 15,000 | | 17,500 |
| 5.00 – 7.49 | 17,500 | | 20,000 |
| 7.50 – 10.00 | 20,000 | | 22,500 |
| 10.00 – 14.99 | 22,500 | 7,500 | 25,000 |
| 15.00 – 24.99 | 25,000 | | 27,500 |
| 25.00 – 34.99 | 30,000 | 10,000 | 30,000 |
| මිලියන 35 ට වැඩි | 35,000 | | 35,000 |

ii. ප්‍රතිපූරණ වියදම්
අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු අයකිරීම් ආදිය.

iii. මුල් මුදලේ කොටස් පියවීමේ ගාස්තුව (අදාළ නම්)
මෙම ගාස්තුව, මුල් මුදල පියවීමේ කොටසෙන් 5% ක් ලෙස ගණනය කෙරේ.

iv. ගෙවීම් පැහැර හැරීමේ ගාස්තු
මාසික කුලිය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට කුලිය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික කුලිය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. මෙම අගය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.

## 2.පීපල්ස් සූර්ය බලශක්ති කල්බදු පහසුකම

| | |
|---|---|
| **නිෂ්පාදනයේ (ලීසිං පහසුකමේ) විස්තරය සහ අරමුණ** | **විස්තරය** :<br>**පීපල්ස් ලසිං සමාගමේ** සූර්ය බලශක්ති කල්බදු පහසුකම මඟින් පාරිභෝගික භවතුන්ට ඔවුන්ගේ නේවාසික හෝ ව්‍යාපාරික පරිශ්‍රවල සූර්ය බලශක්ති උත්පාදන ඒකක ස්ථාපනය කිරීමට ඉඩප්‍රස්ථාව විවර කරයි. මෙම පහසුකම නිසා පාරිභෝගික භවතුන්ගේ මාසික විදුලි බිල්පත් සඳහා විසඳුමක් සපයන අතර, අතිරික්ත බලශක්ති ඒකක ජාතික විදුලිබල පද්ධතියට සැපයීමෙන් අමතර ආදායමක් උපයා ගැනීමට අවස්ථාව හිමි වෙයි. තව ද, මෙම පහසුකම නිසා රට තුළ පොසිල ඉන්ධන මත පදනම් වූ විදුලි උත්පාදනය අඩු කිරීමට උපකාරී වේ.<br><br>**අරමුණ**:<br><br>මෙම පහසුකමෙන් නිසා ගෘහස්ථ කාර්යයන් සඳහා සූර්ය විදුලි උත්පාදන ඒකකයක් මිලදී ගැනීමේ සහ ස්ථාපනය කිරීමේ අවස්ථාව ලබාදෙයි. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | “පීපල්ස් ලීසිං සමාගමේ සූර්ය බලශක්ති” කල්බදු පහසුකම් යටතේ පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ අත්වනු ඇත.එනම්:<br>i. සමාගම් අනුමත සැපයුම්කරුවන් හරහා සිදුකරන ලද මිලදී ගැනීම් වෙනුවෙන්, අනෙකුත් නිෂ්පාදන හා සසඳන විට, පිරිනමනු ලබන අඩු පොලී අනුපාත.<br>ii. වසර 7ක් දක්වා ආපසු ගෙවීමේ කාලය.<br>iii. ණය සුදුසුකම් සහ සපයා ඇති ඇපකරය මත පදනම්ව මුළු සූර්ය බලශක්ති ඒකකය සඳහා අරමුදල් සම්පාදනය. |
| **ඉලක්කගත වෙළඳපොල** | මෙම පහසුකමෙන් සතුටුදායක ආපසු ගෙවීමේ හැකියාවක් සහිත පුද්ගලයින් ඉලක්ක කරයි. |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. අවම පහසුකම් කාලය වසරකි.<br>ii. උපරිම පහසුකම් කාලය වසර හතකි.<br>iii. පහසුකම සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ලබා දීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි සිදුවේ.<br>iv. පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවා දැමීමකින් තොරව, බදු දී ඇති වත්කම වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br>v. ලීසිං පහසුකම පියවීමේ දී අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමමක් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>පහත විස්තර ලබා දීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br><u>තනි පුද්ගලයන් **සඳහා**</u><br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරී සහතිකය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු |

<table>
<tr><td></td><td>කිරීමේ වෙනත් සාක්ෂි)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. වත්කම් විස්තර (සූර්ය බලශක්ති ඒකකයේ විස්තර, සැපයුම්කරුගේ විස්තර/වාහනයේ විස්තර)</td></tr>
<tr><td>නීතිමය විධිවිධාන</td><td>2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත</td></tr>
<tr><td>පොලී අනුපාතය</td><td>පොලී අනුපාත පාරිභෝගිකයාගේ ණය අවදානම මත පදනම් වන අතර, 9% සිට 40% දක්වා පරාසයක පවතී.</td></tr>
<tr><td>ගාස්තු සහ අයකිරීම්</td><td>සූර්ය බලශක්ති කල්බදු  පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.<br><br>i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව<br><br>
<table>
<tr><th>පහසුකමේ වටිනාකම (රුපි. මිලියන)</th><th>සැකසුම් ගාස්තුව (රුපි.)</th><th>පරීක්ෂණ ගාස්තුව (රුපි.).)</th></tr>
<tr><td>මිලියන 1 ක් දක්වා</td><td>7,500</td><td>10,000</td></tr>
<tr><td>1.00 – 1.99</td><td>10,000</td><td>12,500</td></tr>
<tr><td>2.00 – 2.99</td><td>12,500</td><td>15,000</td></tr>
<tr><td>3.00 – 4.99</td><td>15,000</td><td>17,500</td></tr>
<tr><td>5.00 – 7.49</td><td>17,500</td><td>20,000</td></tr>
<tr><td>7.50 – 10.00</td><td>20,000</td><td>22,500</td></tr>
<tr><td>10.00 – 14.99</td><td>22,500</td><td>25,000</td></tr>
<tr><td>15.00 – 24.99</td><td>25,000</td><td>27,500</td></tr>
<tr><td>25.00 – 34.99</td><td>30,000</td><td>30,000</td></tr>
<tr><td>මිලියන 35 ට වැඩි</td><td>35,000</td><td>35,000</td></tr>
</table>
<br>ii. ප්‍රතිපූරණ වියදම්<br>අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු ආදිය.<br>iii. ගෙවීම් පැහැර හැරීමේ ගාස්තු - මාසික කුලිය ගෙවීම සඳහා ණය ගැණුම්කරුට කුලිය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් හිමි වේ. ණය ගැණුම්කරු විසින් නියමිත දිනට හෝ සහන කාලය තුළ මාසික කුලිය නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. මෙම අගය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.</td></tr>
</table>

3. **වාහන ණය**

| | |
|---|---|
| **නිෂ්පාදනයේ (වාහන ණය පහසුකමේ) විස්තරය සහ අරමුණ** | වාහනයක් මිලදී ගැනීමට හෝ සිය පෞද්ගලික හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා මුදල් යෙදවීමට අදහස් කරන පාරිභෝගික භවතුන් සඳහා මෝටර් රථ උකස් කිරීමෙන් මෙම වාහන ණය පහසුකම පිරිනමනු ලැබේ. මෙම වාහන ණය පහසුකම යටතේ උකස් කිරීමට සුදුසුකම් ලබන්නේ මෝටර් රථ, ක්‍රීඩා උපයෝගිතා වාහන (SUV), ජීප් රථ සහ ද්විත්ව කාර්ය වාණිජ නොවන වාහන පමණි.<br><br>සමාගම විසින් උපරිම වශයෙන් වසර පහක කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාතය යටතේ වාහන ණය පහසුකම් ද වසර හතක දක්වා කාලයක් සඳහා විචල්‍ය පොලී අනුපාතය යටතේ ද ණය පහසුකම් ලබා දෙනු ලැබේ. කෙසේ වෙතත්, පවතින වෙළඳ පොල තත්ත්වයන්ට යටත්ව, කළමනාකාරීත්වයේ අභිමතය පරිදි විචල්‍ය පොලී අනුපාත යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | පීපල්ස් ලීසිං පීඑල්සී සමාගම වෙතින් වාහන ණය පහසුකම් ලබාගැනීමෙන් පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ අත්කරගත හැකිය.එනම්:<br>i. ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත පහසුකම් (කළමනාකාරීත්වයේ අභිමතය පරිදි විචල්‍ය පොලී අනුපාත පහසුකම් පිරිනමනු ලැබේ.)<br>ii. පාරිභෝගිකයාගේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි සකස් කරන ලද නම්‍යශීලී වාරික සැලසුම්.<br>iii. වසර 7ක් දක්වා ණයකාලසීමාවන් (ස්ථාවර පොලී අනුපාත පහසුකම් යටතේ උපරිම වසර 5ක් සහිතව)<br>iv. නිශ්චිත කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාතයක් සහිතව ද, ඉන්පසු ඉතිරි කාලය සඳහා විචල්‍ය පොලී අනුපාතයක් සහිතව ද, මූල්‍යකරණ පහසුකම් ලබාගැනීමේ හැකියාව (විචල්‍ය පොලී අනුපාත කළමනාකාරීත්වයේ අභිමතයට යටත් වේ.)<br>v. හිඟ මුල් මුදල අර්ධ වශයෙන් අඩුකරගැනීම සඳහා මුල් මුදලට ගෙවීම් කිරීමේ හැකියාව (විචල්‍ය පොලී අනුපාත පහසුකම් සඳහා පමණක් ලබාගත හැකිය.)<br>vi. ආපසු ගෙවීමේ කාලය තුළ දී, අදාළ වත්කම වෙනුවට ඉහළ වෙළඳ පොල වටිනාකමක් ඇති ඊට සමාන වත්කම් වර්ගයක් ලබාදීමේ හැකියාව. |
| **ඉලක්කගත වෙළඳ පොල** | මෙම පහසුකමෙන් වාහන මිලදී ගැනීමට අදහස් කරන හෝ පෞද්ගලික හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා අරමුදල් අවශ්‍ය කරන පුද්ගලයින් සහ ව්‍යාපාරික ආයතන ඉලක්ක කරනු ලැබේ. |

| | |
|---|---|
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. අවම පහසුකම් කාලය මාසයකි.<br>ii. උපරිම පහසුකම් කාලය වසර හතකි.<br>iii. පහසුකම සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ලබාදීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි සිදුවේ.<br>iv. උකස් කළ වත්කම, ණය පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවීමකින් තොරව වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br>iv. ණය පහසුකම පියවීමේ දී අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමක් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>පහත විස්තර ලබා දීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br>**<u>තනි පුද්ගලයන් සඳහා</u>**<br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)<br>ii. ලිපින ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරි සහතිකය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. වාහන විස්තර (සැපයුම්කරුගේ විස්තර/වාහනයේ විස්තර)<br><br>**<u>ආයතනික පාරිභෝගික භවතුන් සඳහා</u>**<br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය/41වන ආකෘතිය හෝ 1 වන ආකෘති පත්‍රය**)**<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (13 වන ආකෘතිය**)**<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (මූල්‍ය ප්‍රකාශ/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි ලේඛන)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. වාහන විස්තර (සැපයුම්කරුගේ විස්තර/වාහන විස්තර) |
| **නීතිමය විධිවිධාන** | 1990 අංක 3 දරන පනතින් සංශෝධිත 1946 අංක 06 දරන උකස් පනත |
| **පොලී අනුපාතය** | පොලී අනුපාත පාරිභෝගිකයාගේ ණය අවදානම මත පදනම් වන අතර, **12%** සිට **40%** දක්වා පරාසයක පවතී. |

<table>
<tr>
<td>ගාස්තු සහ අයකිරීම්</td>
<td>
ණය පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.<br><br>
i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව<br><br>
<table>
<tr><th>පහසුකමේ වටිනාකම (රුපි. මිලියන)</th><th>සැකසුම් ගාස්තුව (රුපි.)</th><th>පරීක්ෂණ ගාස්තුව (රුපි.).)</th></tr>
<tr><td>මිලියන 1 ක් දක්වා</td><td>7,500</td><td rowspan="6">5,000</td></tr>
<tr><td>1.00 – 1.99</td><td>10,000</td></tr>
<tr><td>2.00 – 2.99</td><td>12,500</td></tr>
<tr><td>3.00 – 4.99</td><td>15,000</td></tr>
<tr><td>5.00 – 7.49</td><td>17,500</td></tr>
<tr><td>7.50 – 10.00</td><td>20,000</td></tr>
<tr><td>10.00 – 14.99</td><td>22,500</td><td rowspan="2">7,500</td></tr>
<tr><td>15.00 – 24.99</td><td>25,000</td></tr>
<tr><td>25.00 – 34.99</td><td>30,000</td><td rowspan="2">10,000</td></tr>
<tr><td>මිලියන 35 ට වැඩි</td><td>35,000</td></tr>
</table>
<br>
ii. ප්‍රති රණ වියදම්<br>
අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු අයකිරීම් ආදිය.<br>
iii. මුල් මුදලේ කොටස් පියවීමේ ගාස්තුව (අදාළ නම්)<br>
මෙම ගාස්තුව, මුල් මුදල පියවීමේ කොටසෙන් 5% ක් ලෙස ගණනය කෙරේ.<br>
iv. ගෙවීම් පැහැර හැරීමේ ගාස්තු<br><br>
මාසික වාරිකය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට එකී වාරිකය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික වාරිකය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. මෙම අගය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.
</td>
</tr>
</table>

**4.පැවරුම් ණය** (Assignment Loan)

| | |
|---|---|
| **නිෂ්පාදනයේ (පැවරුම් ණය පහසුකමේ) විස්තරය සහ අරමුණ** | මෙම පැවරුම් ණය පහසුකම, සමාගම සමඟ ක්‍රියාකාරී කල්බදු පහසුකමක් හෝ ණය පහසුකමක් ඇති, පවතින කල්බදු වත්කම් හෝ උකස් කරන ලද වත්කම් ඇපයක් ලෙස භාවිතා කිරීමෙන් පෞද්ගලික හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරන,පාරිභෝගික භවතුන්ට පිරිනමනු ලැබේ. උපරිම ණය කාලය, පැවරුම් ණය පහසුකම යටතේ වත්කම ඇපයක් ලෙස පවරා ඇති කල්බදු හෝ ණය පහසුකමේ ඉතිරි කාල සීමාවට සීමා වේ.<br><br>සමාගම විසින් උපරිම වසර පහක කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාත යටතේ පැවරුම් ණය පහසුකම් ලබාදීම සහ වසර හතක් දක්වා විචල්‍ය පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාදීම සිදුකරනු ලැබේ. කෙසේ වෙතත්, විචල්‍ය පොලී අනුපාත යටතේ පහසුකම් ලබාගත හැක්කේ තෝරාගත් වත්කම් කාණ්ඩ සඳහා පමණක් වන අතර, එය, වෙළඳ පොල තත්ත්වයන් අනුව කළමනාකාරීත්වයේ අභිමතය පරිදි පිරිනමනු ලැබේ. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | පීපල්ස් ලීසිං සමාගම වෙතින් පැවරුම් ණය පහසුකම් ලබාගැනීමෙන් පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ අත්කරගත හැකිය.එනම්:<br>i. ස්ථාවර හෝ විචල්‍ය පොලී අනුපාත පහසුකම් (කළමනාකාරීත්වයේ අභිමතය පරිදි විචල්‍ය පොලී අනුපාත පහසුකම් පිරිනමනු ලැබේ.)<br>ii. පාරිභෝගිකයාගේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි සකස් කරන ලද නම්‍යශීලී වාරික සැලසුම්.<br>iii. වසර 7ක් දක්වා ණයකාලසීමාවන් (ස්ථාවර පොලී අනුපාත පහසුකම් යටතේ උපරිම වසර 5ක් සහිතව)<br>iv. නිශ්චිත කාලයක් සඳහා ස්ථාවර පොලී අනුපාතයක් සහිතව ද, ඉන්පසු ඉතිරි කාලය සඳහා විචල්‍ය පොලී අනුපාතයක් සහිතව ද, මූල්‍යකරණ පහසුකම් ලබාගැනීමේ මනාපය (විචල්‍ය පොලී අනුපාත කළමනාකාරීත්වයේ අභිමතයට යටත් වේ.) |
| **ඉලක්කගත වෙළඳ පොල** | මෙම පහසුකමෙන් වාහන මිලදී ගැනීමට අදහස් කරන හෝ පෞද්ගලික හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා අරමුදල් අවශ්‍ය කරන පුද්ගලයින් සහ ව්‍යාපාරික ආයතන ඉලක්ක කරනු ලැබේ. |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. අවම පහසුකම් කාලය මාසයකි.<br>ii. උපරිම පහසුකම් කාලය වසර හතකි.<br>iii. පහසුකම සඳහා විචල්‍ය පොලි අනුපාතයක් ලබාදීම කළමනාකාරීත්වයේ අභිමතය පරිදි සිදුවේ.<br>iv. පැවරූ වත්කම, ණය පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවීමකින් තොරව වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br>v. ණය පහසුකම පියවීමේ දී අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමක් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>පහත විස්තර ලබාදීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br>**<u>තනි පුද්ගලයන් සඳහා</u>**<br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු |

බලපත්‍රය, ගමන් බලපත්‍රය)
ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරි සහතිකය)
iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)
vi. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)
v. ඇපයේ විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර)

**<u>ආයතනික පාරිභෝගික භවතුන් සඳහා</u>**

i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය/41වන ආකෘතිය හෝ 1 වන ආකෘතිය)
ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (13 වන ආකෘතිය)
iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (මූල්‍ය ප්‍රකාශ/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි ලේඛන)
iv. ඇපයේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි/ ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි -13 වන ආකෘතිය)
v. වාහන විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර)

**නීතිමය විධිවිධාන**

ඉංග්‍රීසි ගිවිසුම් නීතිය

**පොලී අනුපාතය**

පොලී අනුපාත පාරිභෝගිකයාගේ ණය අවදානම මත පදනම් වන අතර, 12% සිට 40% දක්වා පරාසයක පවතී.

**ගාස්තු සහ අයකිරීම්**

පැවරුම් ණය පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.

i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව

| පහසුකමේ වටිනාකම (රුපි. මිලියන) | සැකසුම් ගාස්තුව (රුපි.) | පරීක්ෂණ ගාස්තුව (රුපි.) | |
|---|---|---|---|
| | | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සුරැකුම සහිතව පහසුකම් | වෙනත් සුරැකුම |
| මිලියන 1 ක් දක්වා | 7,500 | 5,000 | 10,000 |
| 1.00 – 1.99 | 10,000 | | 12,500 |
| 2.00 – 2.99 | 12,500 | | 15,000 |
| 3.00 – 4.99 | 15,000 | | 17,500 |
| 5.00 – 7.49 | 17,500 | | 20,000 |
| 7.50 – 10.00 | 20,000 | | 22,500 |
| 10.00 – 14.99 | 22,500 | 7,500 | 25,000 |
| 15.00 – 24.99 | 25,000 | | 27,500 |
| 25.00 – 34.99 | 30,000 | 10,000 | 30,000 |
| මිලියන 35 ට වැඩි | 35,000 | | 35,000 |

ii. ප්‍රති රණ වියදම්
අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු, මෝටර් රථ ප්‍රවාහන

| | |
|---|---|
| | දෙපාර්තමේන්තු අයකිරීම් ආදිය.<br>iii. හිමිකම් පරීක්ෂාව (අදාළ වේ නම්) රුපි. 15,000/-<br>iv. උකස් ගාස්තුව(අදාළ වේ නම්)<br>v. නීති ගාස්තුව(අදාළ වේ නම්)<br>vi. කේවියට් ගාස්තුව(අදාළ වේ නම්)<br>vii. පහසුකම ආපු ගෙවීම පැහැර හැරීම<br>මාසික වාරිකය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට වාරිකය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික වාරිකය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොළී අනුපාතයක් අදාළ වේ. මෙම අගය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය. |

## 5. ක්ෂණික මුදල් ණය (Quick Cash Loan)

| | |
|---|---|
| **නිෂ්පාදන යේ (ක්ෂණික මුදල් ණය පහසුක මේ) විස්තරය සහ අරමුණ** | ක්ෂණික මුදල් ණය යනු ස්ථාවර ආදායමක් හිමි ශ්‍රී ලාංකිකයන්ගේ සාධාරණ පෞද්ගලික හෝ වාණිජ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති, පුද්ගලික ඇපකරුවන් දෙදෙනෙකුගේ සහාය ඇතිව ලබාගත හැකි පෞද්ගලික ණයක් වේ. |
| **පාරිභෝගි ක භවතුන්ට අත්වන වාසි** | පීපල්ස් ලීසිං සමාගම වෙතින් ක්ෂණික මුදල් ණය පහසුකම් ලබාගැනීමෙන් පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ අත්කරගත හැකිය.එනම්:<br><br>i. පුද්ගලික ඇපකරුවන් හැර වෙනත් කිසිදු ඇපයක් අවශ්‍ය නොවේ.<br>ii. ඕනෑම සාධාරණ පෞද්ගලික හෝ වාණිජ අවශ්‍යතාවයක් සඳහා ණය ලබාදෙනු ලැබේ.<br>iii. ක්ෂණික මුදල් ණය ක්‍රමය සරල හා ඉක්මන් වන අතර, එමගින් පාරිභෝගික භවතුන්ට අනෙකුත් ණය යෝජනා ක්‍රමවල මෙන් වැඩි කාලයක් නාස්ති නොකර ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා ඉතාමත් පහසුවෙන් සපුරා ගැනීමට හැකි වේ. |
| **ඉලක්කගත වෙළඳ පොල** | ඕනෑම සාධාරණ පෞද්ගලික හෝ වාණිජමය අවශ්‍යතාවයක් සඳහා ණය පහසුකමක් ලබා ගැනීමට අදහස් කරන ස්ථාවර ආදායම් මාර්ගයක් සහිත ශ්‍රී ලාංකිකයන්**.** |
| **ප්‍රධාන නියම යන් සහ කො න්දේසි** | i. අයදුම්කරු ස්ථාවර ආදායමක් ඇති ශ්‍රී ලාංකික පුද්ගලයෙකු විය යුතුය.<br>ii. උපරිම ණය පහසුකම් මුදල රුපියල් 10,000,000/- ක් වේ.<br>iii. උපරිම පහසුකම් කාලය මාස 60 ක් වේ.<br>iv. සමාන වාරිකවලින් පමණක් ආපසු ගෙවීමට අවසර ලැබේ.<br>v. ඇපකරුවන් දෙදෙනාම ස්ථාවර ආදායම් මාර්ග ඇති ශ්‍රී ලාංකිකයන් විය යුතුය.<br>vi. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කිරීම අනිවාර්ය වේ.<br>vii. පහසුකම ලබාදෙන අවස්ථාවේ දී පාරිභෝගිකයාගේ වයස අවුරුදු 60 ට අඩු විය යුතුය.<br>viii. පිළිගත හැකි රක්ෂණ සමාගමකින් ණය ආරක්ෂණ ආවරණයක් ලබාගත |

යුතුය.

ix. පහසුකම සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ලබාදීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි සිදුවේ.
x. ණය පහසුකම පියවීමේ දී අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමක් සඳහා අවසර දෙනු ලැබේ.

පහත විස්තර ලබාදීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :

i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)
ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරි සහතිකය)
iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)
iv. ඇපකරුවන්ගේ විස්තර (ජාතික හැඳුනුම්පත/ බිල්පත් සාක්ෂි/ ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)

**නීතිමය විධිවිධාන**

ඉංග්‍රීසි ගිවිසුම් නීතිය

**පොලී අනුපාතය**

පොලී අනුපාත පාරිභෝගිකයාගේ අවදානම් පැතිකඩ මත පදනම් වන අතර, 12% සිට 40% දක්වා පරාසයක පවතී

**ගාස්තු සහ අයකිරීම්**

ක්ෂණික මුදල් ණය පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.

i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව

| පහසුකමේ වටිනාකම (රුපි. මිලියන) | සැකසුම් ගාස්තුව (රුපි.) | පරීක්ෂණ ගාස්තුව (රුපි.) |
|---|---|---|
| මිලියන 1 ක් දක්වා | 7,500 | 10,000 |
| 1.00 – 1.99 | 10,000 | 12,500 |
| 2.00 – 2.99 | 12,500 | 15,000 |
| 3.00 – 4.99 | 15,000 | 17,500 |
| 5.00 – 7.49 | 17,500 | 20,000 |
| 7.50 – 10.00 | 20,000 | 22,500 |

ii. පහසුකම ආපු ගෙවීම පැහැර හැරීම
මාසික වාරිකය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට වාරිකය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික වාරිකය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. මෙම අගය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.

**6. ෆාස්ට් ට්‍රැක් ණය (Fast Track Loan)**

| | |
|---|---|
| **නිෂ්පාදනයේ (ෆාස්ට් ට්‍රැක් ණය පහසුකමේ) විස්තරය සහ අරමුණ** | ෆාස්ට් ට්‍රැක් ණය පහසුකම යනු ගනුදෙනුකරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් සපුරා ගැනීම ඇතුළුව ඔවුන්ගේ ක්ෂණික මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස සැලසුම් කර ඇති කෙටි කාලීන චක්‍රීය ණය පහසුකමකි. ගනුදෙනුකරුවන් විසින් අදාළ උපචිත පොලිය අවම වශයෙන් මාසික වාරිකය වශයෙන් ගෙවිය යුතුය. ණය පහසුකම් කාලය තුළ, ඕනෑම අවස්ථාවක කිසිදු ගාස්තුවකින් තොරව මුල් මුදල අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම ගෙවා පියවිය හැකිය.<br>ණය පහසුකම් කාලය තුළ, අනුමත ණය පහසුකමේ සීමාවට යටත්ව, අවශ්‍ය වන පරිදි ණය ලබාදීමක් කරන ලෙස ගනුදෙනුකරුවන් විසින් ඉල්ලා සිටිය හැකිය. අදාළ ණය පියවීමේ ගාස්තු ගෙවීමෙන් පසුව, ණය පහසුකම කල්පිරීමට පෙර සම්පූර්ණයෙන්ම ගෙවා පියවා දැමිය හැකිය. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | අනුමත ණය කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක අනුමත සීමාව තුළ ණය මුදල ලබාගැනීමට සහ නැවත භාවිතා කිරීමට පාරිභෝගිකයාට හැකියාව ඇත. කෙසේ වෙතත්, පද්ධතිය මෙය එකම ණය පහසුකමක් ලෙස දිගටම කරගෙන යනු ඇත.<br><br>අනුමත ණය මුදලේ සම්පූර්ණ මුදල එකවර හෝ කොටස් කිහිපයකින් ලබාගැනීමට පාරිභෝගිකයාට හැකියාව ඇත. එහි දී, කොටස් ලෙස ලබාගත් සියල්ල එකම පහසුකම ලෙස පද්ධතිය තුළ පෙන්වනු ලැබේ. |

| | |
|---|---|
| **ඉලක්ක ගත වෙළඳ පොල** | " ෆාස්ට් ට්‍රැක් ණය " (Fast Track) පහසුකම සඳහා ප්‍රධාන ඉලක්ක වෙළඳ පොළ වන්නේ හොඳ ණය වාර්තාවක් ඇති දැනට සිටින පාරිභෝගික භවතුන්ය. කෙසේ වෙතත්, හොඳ මූල්‍ය පසුබිමක් ඇති නව පාරිභෝගික භවතුන් ද සලකා බලනු ලැබේ. |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. උපරිම පහසුකම් කාලය මාස පහළොවකි.<br>ii. අවම මාසික වාරිකය හිඟ මුල් මුදල සඳහා වන පොලිය වේ.<br>iii. හිඟ මුල් මුදල අඩු කිරීම සඳහා කිසිදු අමතර ගාස්තුවකින් තොරව පාරිභෝගික භවතුන්ට ඩැඩිපුර මුදල් ප්‍රමාණයක් එකවර ගෙවීම (අර්ධ වශයෙන් මුල් මුදල ගෙවීම්) සිදුකළ හැකිය.<br>iv. පහසුකම සඳහා ඇපයක් ලෙස චංචල හෝ නිශ්චල වත්කමක් උකස් කිරීම අනිවාර්ය වේ.<br>v. උකස් කළ වත්කම, ණය පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවීමකින් තොරව වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br><br>පහත විස්තර ලබාදීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br>**<u>තනි පුද්ගලයන් සඳහා</u>**<br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරි සහතිකය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත/ බිල්පත් සාක්ෂි / ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. ඇපයේ විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර)<br><br>**<u>ආයතනික පාරිභෝගික භවතුන් සඳහා</u>**<br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය/41වන ආකෘතිය හෝ 1 වන ආකෘතිය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (13 වන ආකෘතිය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (මූල්‍ය ප්‍රකාශ/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි ලේඛන)<br>iv.ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි/ ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි -13 වන ආකෘතිය)<br>v.ඇපයේ විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර) |
| **නීතිමය විධිවිධාන** | 1990 අංක 3 දරන පනතින් සංශෝධිත 1946 අංක 06 දරන උකස් පනත |
| **පොලී අනුපාතය** | පොලී අනුපාත පාරිභෝගිකයාගේ අවදානම් පැතිකඩ මත පදනම් වන අතර, 12% සිට 40% දක්වා පරාසයක පවතී |

**ගාස්තු සහ අයකිරීම්**

" ෆාස්ට් ට්‍රැක් ණය " (Fast Track) පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.

i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව

| **පහසුකමේ වටිනාකම (රුපි. මිලියන)** | **සැකසුම් ගාස්තුව (රුපි.)** | **පරීක්ෂණ ගාස්තුව (රුපි.)** | |
|---|---|---|---|
| | | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සුරැකුම සහිතව පහසුකම්** | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සුරැකුම සහිතව පහසුකම්** |
| මිලියන 1 ක් දක්වා | 7,500 | 5,000 | 10,000 |
| 1.00 – 1.99 | 10,000 | | 12,500 |
| 2.00 – 2.99 | 12,500 | | 15,000 |
| 3.00 – 4.99 | 15,000 | | 17,500 |
| 5.00 – 7.49 | 17,500 | | 20,000 |
| 7.50 – 10.00 | 20,000 | | 22,500 |
| 10.00 – 14.99 | 22,500 | 7,500 | 25,000 |
| 15.00 – 24.99 | 25,000 | | 27,500 |
| 25.00 – 34.99 | 30,000 | 10,000 | 30,000 |
| මිලියන 35 ට වැඩි | 35,000 | | 35,000 |

ii. ප්‍රතිපූරණ වියදම්

අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු අයකිරීම් ආදිය.

iii කලින් ණය පියවීමේ ගාස්තුව

ෆාස්ට් ට්‍රැක් ණය පහසුකම ණය ගිවිසුමේ දින සිට මාස හයක් (6) ඇතුළත සම්පූර්ණයෙන්ම ගෙවා පියවා දමන්නේ නම්, ණය පහසුකම් මුදලින් 2% ක කලින් ණය පියවීමේ ගාස්තුවක් අයකරනු ඇත.

iv. උකස් ගාස්තුව(අදාළ වේ නම්)

v. නීති ගාස්තුව(අදාළ වේ නම්)

vi. කේව්යට් ගාස්තුව(අදාළ වේ නම්)

vii. පහසුකම ආපු ගෙවීම පැහැර හැරීම

මාසික වාරිකය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට වාරිකය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික වාරිකය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, ණය මුදලේ පොලී අනුපාතය 4% කින් වැඩි කරනු ලැබේ. මෙම පොලී අනුපාතයක් ගැළපීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් වේ.

## 07. ටර්ම් ලෝන් (Term Loan)

| | |
|---|---|
| **නිෂ්පාදනයේ (ටර්ම් ලෝන් පහසුකමේ) විස්තරය සහ අරමුණ** | ඉඩම් සහ ගොඩනැගිලි වැනි නිශ්චල දේපළ උකස් කිරීමෙන් ටර්ම් ලෝන් ලබාදෙනු ලැබේ. මෙම ණය පහසුකම, දැනට සිටින, ප්‍රධාන වශයෙන් යහපත් ලෙස ණය ආපසු ගෙවීමේ වාර්තාවක් ඇති, පාරිභෝගික භවතුන් සඳහා දේපළ මිලදී ගැනීම පිණිස හෝ ඕනෑම සාධාරණීකරණය කළ හැකි පෞද්ගලික හෝ වාණිජ අවශ්‍යතාවක් සපුරාලීම සඳහා හෝ සපයනු ලැබේ. |
| **පාරිභෝගික භවතුන්ට අත්වන වාසි** | පීපල්ස් ලීසිං සමාගම වෙතින් ටර්ම් ලෝන් පහසුකම් ලබාගැනීමෙන් පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ප්‍රතිලාභ අත්කරගත හැකිය.එනම්:<br><br>i. පාරිභෝගික භවතුන්ගේ මුදල් ප්‍රවාහයට අනුකූලව සකස් කරන ලද නම්‍යශීලී වාරික සැලසුම්.<br>ii. වසර 5ක් දක්වා ණය කාල සීමාවන් |
| **ඉලක්කගත වෙළඳපොල** | සතුටුදායක ලෙස ණය ආපසු ගෙවීමේ වාර්තාවක් සහිත දැනට සිටින පාරිභෝගික භවතුන් |
| **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** | i. අවම පහසුකම් කාලය වසරකි.<br>ii. උපරිම පහසුකම් කාලය වසර පහකි.<br>iii. පහසුකම සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ලබා දීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි සිදුවේ.<br>iv. උකස් තබන ලද වත්කම, ණය පහසුකම සම්පූර්ණයෙන්ම ගෙවා පියවීමකින් තොරව වෙනත් පාර්ශ්වයකට පැවරීම කළ නොහැකිය.<br>v. ණය පහසුකම පියවීමේ දී අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් කලින් පියවීමක් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>පහත විස්තර ලබාදීමෙන් පාරිභෝගික භවතුන්ට මෙම පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය. එනම් :<br><u>තනි පුද්ගලයන් සඳහා</u><br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (ජාතික හැඳුනුම්පත/ජල විදුලි ආදී උපයෝගිතා බිල්පත/ග්‍රාම නිලධාරී සහතිකය)<br>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (වැටුප් පත්‍රිකා/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි)<br>iv. ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත/ බිල්පත් සාක්ෂි / ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි)<br>v. ඇපයේ විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර)<br><br>**<u>ආයතනික පාරිභෝගික භවතුන් සඳහා</u>**<br><br>i. අනන්‍යතාව ඔප්පු කිරීමේ සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචිය/41වන ආකෘතිය හෝ 1 වන ආකෘතිය)<br>ii. ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි (13 වන ආකෘතිය**)** |

<table>
<tr>
<td></td>
<td>iii. ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි (මූල්‍ය ප්‍රකාශ/බැංකු ලේඛන/ ආදායම් ඔප්පු කිරීමේ වෙනත් සාක්ෂි ලේඛන)<br>iv.ඇපකරුගේ විස්තර (ජාතික හැඳුනුම්පත,/බිල්පත් සාක්ෂි/ආදායම් ඔප්පු කිරීමේ සාක්ෂි/ ලිපිනය ඔප්පු කිරීමේ සාක්ෂි -13 වන ආකෘතිය)<br>v.ඇපයේ විස්තර (වාහනයේ හෝ දේපලේ විස්තර)</td>
</tr>
<tr>
<td>නීතිමය විධිවිධාන</td>
<td>1990 අංක 3 දරන පනතින් සංශෝධිත 1946 අංක 06 දරන උකස් පනත</td>
</tr>
<tr>
<td>පොලී අනුපාතය</td>
<td>පොලී අනුපාත පාරිභෝගිකයාගේ අවදානම් පැතිකඩ මත පදනම් වන අතර, 12% සිට 40% දක්වා පරාසයක පවතී.</td>
</tr>
<tr>
<td>ගාස්තු සහ අයකිරීම්</td>
<td>කාලීන ණය පහසුකම සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ.<br><br>i. සැකසුම් ගාස්තුව සහ පරීක්ෂණ ගාස්තුව
<table>
<tr><th>පහසුකමේ වටිනාකම (රුපි. මිලියන)</th><th>සැකසුම් ගාස්තුව (රුපි.)</th><th>පරීක්ෂණ ගාස්තුව (රුපි.)</th></tr>
<tr><td>මිලියන 1 ක් දක්වා</td><td>7,500</td><td>10,000</td></tr>
<tr><td>1.00 – 1.99</td><td>10,000</td><td>12,500</td></tr>
<tr><td>2.00 – 2.99</td><td>12,500</td><td>15,000</td></tr>
<tr><td>3.00 – 4.99</td><td>15,000</td><td>17,500</td></tr>
<tr><td>5.00 – 7.49</td><td>17,500</td><td>20,000</td></tr>
<tr><td>7.50 – 10.00</td><td>20,000</td><td>22,500</td></tr>
<tr><td>10.00 – 14.99</td><td>22,500</td><td>25,000</td></tr>
<tr><td>15.00 – 24.99</td><td>25,000</td><td>27,500</td></tr>
<tr><td>25.00 – 34.99</td><td>30,000</td><td>30,000</td></tr>
<tr><td>මිලියන 35 ට වැඩි</td><td>35,000</td><td>35,000</td></tr>
</table>
<br>ii. ප්‍රතිපූරණ වියදම්<br>අදාළ බදු, රක්ෂණ ගාස්තු, තක්සේරු ගාස්තු,<br>iii. හිමිකම් පරීක්ෂාව (අදාළ වේ නම්) රුපි. 15,000/-<br>iv. උකස් ගාස්තුව(අදාළ වේ නම්)<br>v. නීති ගාස්තුව(අදාළ වේ නම්)<br>vi. කේවියට් ගාස්තුව(අදාළ වේ නම්)<br>vii. පහසුකම ආපු ගෙවීම පැහැර හැරීම<br>මාසික වාරිකය ගෙවීම සඳහා, ණය ගැණුම්කරුට වාරිකය ගෙවීමේ නියමිත දින සිට දින 5 ක සහන කාලයක් තිබේ. ණය ගැණුම්කරු විසින් මාසික වාරිකය නියමිත දිනට හෝ සහන කාලය තුළ නොගෙවන්නේ නම්, වාර්ෂිකව 48% ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. මෙම අගය ගැළපීම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වෙනස් කළ හැකිය.</td>
</tr>
</table>

<u>පැමිණිලි කළමනාකරණ කිරීමේ කාර්ය පටිපාටිය</u>

සිය පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පාරිභෝගික භවතුන්ට පහත සඳහන් ක්‍රම සලසා තිබේ.

- අදාළ ශාඛා කළමනාකරු හරහා පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
- පෞද්ගලිකව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

  කොළඹ 08, මරදාන පාර**,** අංක 1161 දරන ලිපිනයේ පිහිටි සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික සේවා සහ ආරවුල් විසඳීමේ දෙපාර්තමේන්තුව වෙත වැඩ කරන වේලාවන් තුළ පැමිණ ලිඛිතව ලිපියක් ඉදිරිපත් කර සම්පූර්ණ විස්තර ලබාදීමෙන්, පාරිභෝගිකයෙකුට පෞද්ගලිකවම පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.
- විද්‍යුත් තැපෑල වන **<u>customerservices@plc.lk</u>** වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
- අංක 0112206300 දරන දුරකථනය ඔස්සේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
- කොළඹ 08, මරදාන පාර**,** අංක 1161 දරන ලිපිනයේ පිහිටි සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික සේවා සහ ආරවුල් විසඳීමේ දෙපාර්තමේන්තුව වෙත ලියා දැක්වීමෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
- පහත සබැඳිය / පිවිසුම හරහා පැමිණිල්ල ඉදිරිපත් කිරීමේ ආකෘතිය බාගත කරගත හැකිය.

https://www.plc.lk/wp-content/uploads/2023/02/Customer-Complaint-Grievance-Handling-Form.pdf
www.plc.lk ---> Quick Links ----> Stakeholder Feedback ----> Complaint & Grievances ---- > Complaint & Grievances Submission Form (Download)

අප මූල්‍ය සමාගම විසින් සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත්, පාරිභෝගික භවතුන් විසින් එම ආරවුල්ගත කාරණය පහත සඳහන් ආරවුල් විසඳීමේ බාහිර යාන්ත්‍රණයන් වෙත යොමු කළ හැකිය;

**මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (**FCRD)

අධ්‍යක්ෂ**,**
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව **(**FCRD)
ශ්‍රී ලංකා මහ බැංකුව **(**CBSL),
අංක 30**,** ජනාධිපති මාවත**,**
කොළඹ 01.

දුරකථන: 011 247 7966
විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් අංකය: 1935
ෆැක්ස් : +94 11 247 7744
ඊමේල් : fcrd@cbsl.lk
වෙබ් අඩවිය: https://www.cbsl.gov.lk/en

**මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා**

මූල්‍ය ඔම්බුඩ්ස්මන්,
143**A,** වජිර පාර,
කොළඹ 05.

දුරකථන: 011 259 5624
ටෙලිෆැක්ස්: (+94)11 259 5625
විද්‍යුත් තැපෑල: **<u>fosril@sltnet.lk</u>**
වෙබ් අඩවිය: www.financialombudsman.lk